SOCIAL JUSTICE
DECENT WORK

# ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) තම සමාජ සාධාරණත්වය හා සුනිසි මෙහෙවරට වසර 100 ක් සපුරයි.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සියවස් සංවත්සරය වෙනුවෙන් පවත්වනු ලබන සජීවී 24-පැය "ගෝලීය සංචාරය" සඳහා ILO හි සාමාජික රටවල් 187 ක් අතරින් තෝරාගන්නා ලද රටවල් 24 න් එකක් ලෙස ශ්‍රී ලංකාව නම් කළ හැකිය.
- මෙම සමුළුවේ විශේෂ අවධානය යොමු වූයේ ශ්‍රී ලංකා රජය විසින් ILO හි 1930 බලහත්කාරයෙන් සේවය ලබා ගැනීම පිළිබඳ ප්‍රඥප්තියට සම්බන්ධ 2014 අංක 29 ප්‍රෝටොකෝලය (පී-29 නොහොත් P-29) අපරානුමත කිරීම සංකේතාත්මකව සිදුකිරීමයි. ශ්‍රී ලංකාව මෙම ප්‍රඥප්තිය අපරානුමත කළ දකුණු ආසියාවේ ප්‍රථම රාජ්‍ය වන අතර ආසියාවේ දෙවැනි රට බවට පත්වනු ඇත.
- ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ILO හි සියවස් සැමරුම වෙනුවෙන්ම සම්පාදනය කරන ලද කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ කාර්තුමය ශාස්ත්‍රීය ප්‍රකාශනයක් වන ශ්‍රී ලංකා සේවක සඟරාවේ විශේෂ කලාපයක් එළි දැක්විය.

**අප්‍රේල් 11, 2019 කොළඹ, ශ්‍රී ලංකාව:**
පැය 24 යි. නගර 24 ක්. ජාතික වැඩසටහන් 24 ක්.

එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයේ පැරණිතම විශේෂිත/විශේෂඥ ආයතනය වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සිය සමාජ සාධාරණත්වය හා සුනිසි මෙහෙවරට වසර සියයක් සපුරයි. මෙම සැමරුම ලොව මහද්වීප හතරක, රටවල් විසිහතරක, ජාතික වැඩසටහන් විසිහතරක් එක් කර, සජීවී 24-පැය ගෝලීය විකාශන වැඩසටහනක් පැවැතිවිණ. මෙම ගෝලීය සංචාරය ආරම්භ වී කොළඹ, නව දිල්ලිය, බේරූට්, කයිරෝ සහ අනෙකුත් නගර හරහා ගමන් කරනු ලබයි.

කොළඹහිදී පැවැත්වූ ILO හි විචිත්‍රවත් සියවස් සැමරුමට පාදක වූයේ ශ්‍රී ලංකාවේ අනාගත වැඩ ලෝකය හා ඒකාබද්ධ විය යුතු තරුණ කුසලතාවයන් වන අතර මෙය තවත් උත්කර්ෂවත් වූයේ ශ්‍රී ලංකාවේ තාරුණ්‍ය දස්කම් එළිදැක්වූ වේදිකාව නිසාය.

මෙදින සුවිශේෂී කටයුත්තක් වූයේ ILO හි 1930 බලහත්කාරයෙන් සේවය ලබා ගැනීම පිළිබඳ ප්‍රඥප්තියට සම්බන්ධ 2014 අංක 29 ප්‍රෝටොකෝලය (පී-29 නොහොත් P-29) ශ්‍රී ලංකා රජය විසින් අපරානුමත කිරීම සංකේතාත්මකව සිදුකිරීමයි. මේ අවස්ථාවට රාජ්‍යතාන්ත්‍රිකයින්, රජයේ ජ්‍යෙෂ්ඨ මැති ඇමතිවරු, වෘත්තීය සමිති නායකයන්, රජයේ හා පෞද්ගලික ක්ෂේත්‍ර නියෝජනය කරන සේවක සේවිකාවන්, සංවර්ධන සහකරුවන්, ශ්‍රී ලංකාව පුරා විසිරී පැතිරී සිටින මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභිකයන්, ILO හි දැනට සිටින හා හැරගිය සේවක සේවිකාවන් හා මාධ්‍යවේදීන් සහභාගී විය.

දකුණු ආසියාව තුළ මෙම ප්‍රඥප්තිය අපරානුමත කළ ප්‍රථම රට ලෙස ශ්‍රී ලංකාව ඉතිහාස ගතවන අතර ආසියාව තුළ ශ්‍රී ලංකාවට හිමිවන්නේ දෙවන ස්ථානයයි.

මෙම උත්සවයේ මුලසුන දැරුවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වූ අතර කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා සහභාගි විය.

Press Release

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org

*For information only. Not an official record.*

මෙම ප්‍රඥප්තිය අපරානුමත කිරීමත් සමගම බලහත්කාරයෙන් හෝ පීඩනයට ලක් කොට වැඩ ගැනීම ශ්‍රී ලංකාව තුළ අපරාධයක් ලෙස පිළිගැනෙන අතර එය වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙන්ම එයට එරෙහිව කටයුතු කිරීමට හා වින්දිතයන්ට ආරක්ෂාව, පසු පිළියම් හා වන්දි ලබාගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ද සැලසෙනු ඇත.

මෙසේ දියත් කරන ලද 24-පැය ගෝලීය සංවත්සරය සඳහා ILO සාමාජික රටවල් 187 අතරින් රටවල් 24 ක් විශේෂකර තෝරා ගත් අතර ශ්‍රී ලංකාවද ඊට අයත් විය. එම අවස්ථාව නියෝජනය කරමින් ශ්‍රී ලංකාව දේශීය නර්තනාංග, සම්ප්‍රදායික බෙර වාදන සහ සෙවනැලි නාට්‍ය වැනි කලාත්මක අංග හරහා උත්සවය විචිත්‍රවත් කරන්නට යෙදුන අතර, ඒ හරහා ශ්‍රී ලාංකීය ශ්‍රමිකයින් බල ගැන්වීමේ යහපත් අනාගත වැඩපිළිවෙලද ලෝකයට සංදර්ශනය කරන ලදී. එසේම දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල වූ ILO ව්‍යාපෘති වලින් ප්‍රතිලාභ ලබන්නන් විවිධ අවස්ථාවන්හිදී ILO මගින් ඔවුන්ට ලබාදුන් ශක්තිය පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය.

මෙහිදී අදහස් දක්වමින් ගරු කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා පවසා සිටියේ 'වසර සියයක් සැමරීම පිළිබඳව ILO වෙත මාගේ සුබ පැතුම්. සියවස් සංවත්සර ගෝලීය සැමරුම් හා එක්වීම ගැන අපි ආඩම්බරයට පත් වෙනවා. ශ්‍රී ලංකාව 1948 වසරේ සිටම ILO හි සාමාජිකත්වය දරන අතර බලහත්කාරයෙන් සේවය ලබා ගැනීම, නූතන වහල්භාවය, මිනිස් ජාවාරම් සහ ළමා මෙහෙවර ආදිය මුලිනුපුටා දැමීමේ ගෝලීය ව්‍යාපාරයක් ඉදිරියට පවත්වාගෙන යාමේ ILO හි නායකත්වයට සහයක් වීමේ අපේ දීර්ඝ ඉතිහාසය ගැන අපි ඉමහත් ආඩම්බරයට පත් වෙනවා' යනුවෙනි.

මෙම උළෙලේදී ILO හි සියවස් සංවත්සරය වෙනුවෙන් සම්පාදනය කරන ලද ශ්‍රී ලංකා සේවක සඟරාවේ (Sri Lanka Labour Gazette) විශේෂ කලාපයක්ද එළි දැක්වීය. මෙම සේවක සඟරාව යනු කම්රු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ කාර්තුමය ශාස්ත්‍රීය ප්‍රකාශනයයි. එසේම මෙහිදී තැපැල් සහ විදුලි සන්දේශ අමාත්‍යාංශයේ සහයෝගයෙන් සමරු මුද්දරයක් සහ මුල් දින කවරයක්ද නිකුත් කරනු ලැබීය.

ILO හි 100 වන සංවත්සරය පිළිබඳව අදහස් දක්වමින් ශ්‍රී ලංකා හා මාලදිවයින් ILO හි අධ්‍යක්ෂිකා සිම්රිං සිං මහත්මිය මෙසේ පැවසීය. 'ILO හි වරම වන්නේ සමස්ථ සහ ස්ථිරසාර සාමයක් ස්ථාපිත කරනු හැකි වන්නේ එය සමාජ සාධාරණත්වය මත පදනම් වන්නේ නම් පමණක් බවය. පසුගිය වසර සියය පුරාම අපක්ෂපාතී සහ සාධාරණ වැඩ ලෝකයක් නිර්මාණය කිරීමට ILO දායක වී ඇත. එහිදී ශ්‍රී ලංකාවේ සිටින අපගේ සබඳකරුවන් අපට ලබාදී ඇති දායකත්වයට අප ස්තූතිවන්ත වෙනවා. වසර සියයක අපගේ ගමන දෙස ආපසු හැරී බලන මොහොතේ ශ්‍රී ලංකාව තුළ සියලු දෙනාට රැකියා ලැබෙන අනාගතයක් සුරක්ෂිත කරනා බවට අප යළිත් ප්‍රතිඥා දීමට කැමතියි' යනුවෙනි.

මාර්තු මාසයේ දී ILO උතුරු ප්‍රදේශයේ ප්‍රජාවන් සමඟ අප සියවස් මෙහෙයුම සමරන ලදී. තවද 2019 වසරේදී දිවයින පුරා එහි ක්‍රියාකාරීත්වය සැමරීමට කටයුතු කර ඇත. මීළඟ ශතවර්ශය තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතය හසුරාලීම උදෙසා "ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතය" යන මැයෙන් වාර්ථාවක් (a report on the *Future of Work in Sri Lanka*) අප කාර්යාලය විසින් පසුගියදා එළිදැක්වූ අතර තාක්ෂණය මඟින් දියුණුවන ලෝකයක වැඩ ලෝකයට කරන බලපෑම් මෙල්ල කිරීමට දායකත්වය ලබා දෙයි.

ලොව එකම ත්‍රෛයිපාර්ශික ජාත්‍යන්තර සංවිධානය ILO වන අතර මෙහිදී සේවකයින් සහ සේව්‍යයින් රජය සමඟ නියෝජනයේදී සහ තීරණ ගැනීමේදී සමාන මට්ටමක රැඳී සිටී. ඔවුන් එක්ව යහපත් සහ කාර්යක්ෂම වැඩ පිළිවෙතක් උදෙසා කම්කරු ප්‍රමිතීන් සැකසීම සහ ප්‍රතිපත්ති සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කරනු ලබන්නේ නිදහස, සමානාත්මතාවය, ආරක්ෂාව සහ පිළිගැනීම ගොඩනැගීමෙන්ය.

- END -

Press Release

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org

For information only. Not an official record.

Press Release

# ILO පිළිබඳව

ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) යනු එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට ශ්‍රමලෝකය පිළිබඳව විශේෂිත වූ එකම ආයතනයයි. සමාජ සාධාරණත්වය සඳහා ප්‍රමුඛත්වයක් මෙම ආයතනයෙන් ලබාදෙන අතර එය පමුඛ මූලධර්ම හතරක් මත පදනම් වෙයි. එනම් වැඩකිරීමට ඇති අයිතිය, යහපත් රැකියා අවස්ථා, සමාජ ආරක්ෂණය, හා සමාජ කතිකාව වෙයි.

පළමුවන ලෝක යුද්ධයේ අවසානය සනිටුහන් කරන ගිවිසුමේ කොටසක් ලෙස 1919 දී මෙම ආයතනය පිහිටුවන ලද අතර, 1946 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම විශේෂිත ආයතනය වූ ILO, දැන් වසර 100 ක දැනුම, අත්දැකීම් සහ ජයග්‍රහණයන්ගෙන් පරිනත වී ඇත.

1948 දී ශ්‍රී ලංකාව ILO හි සාමාජිකයෙකු බවට පත් විය. 1984 දී ILO ශ්‍රී ලංකා කාර්යාලය කොළඹදී පිහිටුවන ලදී. 2009 වසරේ දී ILO ශ්‍රී ලංකා කාර්යාලය මගින් මාලදිවයින ආවරණයද ආරම්භ කළේය.

2006 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව මුල් කරගනිමින් වැඩසටහන් තුනක් (Decent Work Country Programmes - DWCPs) සැලසුම් කොට ක්‍රියාත්මක කර ඇත. සිව්වන වැඩ සටහනේ (2018-2022) ප්‍රමුඛතා තුනක් තිබේ. එනම් රැකියා ඇතුළුව තිරසාර වැඩසටහන් නිර්මාණය, ශ්‍රම වෙළඳපොළ තුළ යහපාලනයක් ඇති කිරීම, වැඩකිරීමේ අයිතිය ලබා දීම වේ. DWCPs මගින් මේ පිළිබඳ නොයෙකුත් පර්යේෂණ දත්ත සහ දැනුම ජනනය කිරීම සිදුවේ.

ILO හි ශ්‍රී ලංකාවේ සමාජ හවුල්කරුවන් වන්නේ කම්කරු, විදේශ සේවා නියුක්ති අමාත්‍යංශය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු විෂය සඳහා පවතින අමාත්‍යාංශය මෙන්ම ලංකා සේවක සංගම් සම්මේලනය හා වෘත්තීය සමිති වෙයි.

**For more information:**

**Mr. Asitha Seneviratne, ILO Country Office for Sri Lanka and the Maldives: asitha@ilo.org**
**Tel: + 94112592525**
**Website: https://www.ilo.org/colombo/ and https://www.ilo.org/100/en/**



*For information only. Not an official record.*